## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම 20:1-17 **(වරහන් තුළ කොටස් අත්හළ හැකිය.)**

නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.

**(මෝසෙස් තුමන් මගින් දෙන ලද දස පණත)**

දෙවියන් වහන්සේ කතා කොට මේ සියලු ආඥා වදාළ සේක. "වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය. ("නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහි වත් පහළ පොළොවෙහි වත් පොළොවෙන් යට ජලයෙහි වත් ඇති කිසිම වස්තුවකට සමාන දෙයක් හෝ සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකරන්න. ඒවාට නොවඳින්න. මන්ද, නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ වන මා ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකු වන බැවිනි. මට වෛර කරන පියවරුන්ගේ පාපය නිසා තුන්වන, සතරවන පරම්පරාව දක්වා දඬුවම් කරමි. එහෙත් මට ප්‍රේම කරමින්, මාගේ ආඥා පිළිපදින දහස් ගණන් අයට මම කරුණාව දක්වමි.") "නුඹ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිතා නොකරව. යමෙක් ඒ නාමය අගරු ලෙස භාවිතා කරන්නේ ද ඔහුට මම දඬුවම් කරමි. සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. (දවස් හයක් තුළ නුඹ වෙහෙස වී නුඹේ සියලු වැඩ කළ යුතු ය. එහෙත් හත් වන දවස නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට කැප වූ සබතය. එදින නුඹ වත්, නුඹේ පුතු වත්, දුව වත්, නුඹේ සේවකයා වත්, සේවිකාව වත්, නුඹේ සතෙකු වත්, නුඹේ වාසල් දොරටු සීමා ඇතුළ සිටින අමුත්තෙකු වත් කිසි වැඩක් නොකළ යුතු ය. මන්ද සමිඳාණන් වහන්සේ වන මම දින හයක් තුළ අහස හා පොළොව ද, සමුද්‍රය ද, ඒවායේ ඇති සියල්ල ද, සාදා සත්වන දවස නිවාඩු ගත්තෙමි. එබැවින් උන් වහන්සේ සබත් දවසට ආශිර්වාද කොට එය විශුද්ධ කළ සේක.") "නුඹේ පියාට ද මවට ද ගෞරව කරව, එවිට නුඹ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහි ය. මිනී නොමරව, කාමමිථ්‍යාචාරය නොකරව, සොරකම් නොකරව. නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව. නුඹේ අසල්වැසියාගේ ගෘහයට නුඹ ඇළුම් නොකරව. තවද නුඹේ අසල්වැසියාගේ භාර්යාවට හෝ ඔහුගේ සේවකයාට හෝ සේවිකාවට හෝ ඔහුගේ ගවයාට හෝ කොටළුවාට හෝ නුඹේ අසල්වැසියා සතු වෙනත් කිසිවකට හෝ ඇළුම් නොකරව."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 19:7-10

පිළිතුර: සමිඳුනි, සදතන ජීවිතයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය.

ගීය: සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්ත ය. ජීවිතය පණ ගන්වන්නේය. සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය. අනුවණයන්ට නුවණ දෙන්නේය.

සමිඳුන්ගේ අණ පණත් සාධාරණ ය. සිතට සතුට වඩන්නේ ය. සමිඳුන්ගේ අණසක පැහැදිලි ය. දෙනෙතට එළිය දෙන්නේය.

සමිඳුන් කෙරෙහි ගරු බිය නිර්මල ය. එය සදහට ම පවතින්නේ ය. සමිඳුන්ගේ විනිශ්චය යුක්ති සහගත ය. මුළුමනින් ම දැහැමි වේ ම ය.

රනට වඩා පෙරූ රනට වඩා එය මනහර ය. පැණියට වඩා මී පැණියට වඩා එය සුමිහිරි ය.

## දෙවන දේව ප්‍රකාශනය

1 කොරින්ති 1:22-25

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**("අපි කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමු.")**

ජුදෙව්වරු හාස්කම් ඉල්ලති. ග්‍රීක්වරු ප්‍රඥාව සොයති. එහෙත් අපි, කුරුසියේ ඇණ ගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමු. මෙය ජුදෙව්වරුන්ට පැකිළීමකි. විජාතීන්ට ප්‍රලාපයකි. එහෙත් කැඳවීම ලත් ජුදෙව්වරුන්ටත්, ග්‍රීක්වරුන්ටත් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ බලය හා ප්‍රඥාව වේ. ප්‍රලාපයකැ යි කියන දෙවියන් වහන්සේගේ ප්‍රලාපය මිනිස් ප්‍රඥාව ඉක්ම වූ ප්‍රඥාවකි. දුබලකමකැයි කියන දෙවියන් වහන්සේගේ දුබලකම මිනිස් ශක්තිය ඉක්ම වූ ශක්තියකි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 11:25-26

ප්‍රශංසාවත් ගෞරවයත් නිති ඔබටම වේවා ජේසු ස්වාමිනී !

ජේසුස් වහන්සේ කතා කරමින්, පුනරුජ්ජීවනය ද, ජීවනය ද මම වෙමි; මා අදහාගන්නා මැරුණත් ජීවත් වන්නේ ය; ජීවත් ව සිටින, මා අදහාගන්න කිසිවෙක් කිසි කලෙක නො මැරෙන්නේ ය. ඔබ මෙය අදහන්නෙහි දැ"යි ඇසූ සේක.

ප්‍රශංසාවත් ගෞරවයත් නිති ඔබටම වේවා ජේසු ස්වාමිනී !

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 2:13-25

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("මේ දේව මාලිගාව කඩාදමා තෙදිනකින් එය මම ගොඩනගන්නෙමි.")**

ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය ආසන්න ව තිබුණු බැවින්, ජේසුස් වහන්සේ ජෙරුසලමට වැඩම කළ සේක. එවිට, දේව මාලිගාවේ ගව, බැටළු හා පරෙවි වෙළෙන්දන් ද මුදල් මාරු කරන්නන් ද ගනුදෙනුවෙහි යෙදී හිඳිනු උන් වහන්සේ දැක, ලණුවලින් කසයක් සාදාගෙන ගවයන් හා බැටළුවන් හා සියල්ලන් දේව මාලිගාවෙන් පිටතට පලවා හැර, මුදල් මාරු කරන්නන්ගේ කාසි විසුරුවා ඔවුන්ගේ මේස පෙරළා දැමූ සේක. ඉන්පසු උන් වහන්සේ පරෙවි වෙළෙඳුන් අමතා, "මේවා අහකට ගෙන යන්න; මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳ පොළක් නො කරන්නැ"යි වදාළ සේක. "ඔබගේ ගෘහයට ඇති උද්‍යෝගයෙන් මම දැවෙමි"යි ලියා තිබෙන බව එවිට ශ්‍රාවකයන්ට මතක් විය. එකල ජුදෙව්වරු, "ඔබ මේ දේවල් කරන බැවින් ලකුණක් පිණිස කුමන හාස්කමක් අපට දක්වන්නෙහි දැ"යි ඇසූ හ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "මේ දේව මාලිගාව කඩාදමන්න. තෙදිනකින් එය මම ගොඩනගන්නෙමි"යි වදාළ සේක. එවිට ජුදෙව්වරු කතා කොට, "මේ දේව මාලිගාව ගොඩනගන්නට හතළිස් හය වසක් ගත විය. ඔබ එය තෙදිනකින් ගොඩනගන්නෙහි දැ"යි ඇසූ හ. එහෙත්, උන් වහන්සේ කතා කෙළේ, තමන්ගේ ශරීරය නමැති දේව මාලිගාව ගැන ය. උන් වහන්සේ මරණින් නැගිටුවනු ලැබූ පසු, ශ්‍රාවකයෝ, උන් වහන්සේ මේ දේ කී බව සිහි කොට ශුද්ධ ලියවිල්ල ද උන් වහන්සේගේ වචනය ද විශ්වාස කළහ. උන් වහන්සේ පාස්කු මංගල්‍යයේ දී ජෙරුසලමෙහි සිටි කල්හි, බොහෝ දෙනෙක් උන් වහන්සේ කළ හාස්කම් දැක, උන් වහන්සේ අදහාගත්හ. එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන් කෙරෙහි විශ්වාසය නොතැබූ සේක. මන්ද, උන් වහන්සේ සියල්ල දත් නිසා ය. මිනිස් සිතෙහි ඇති දෙය උන් වහන්සේ දැන සිටි බැවින්, මනුෂ්‍යයා ගැන කිසිවෙකුගේ සාක්ෂියක් උන් වහන්සේට අවශ්‍ය නො වී ය..

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.